## 2024-03-11 දින පැවැත්වුණු අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී එළඹුණු තීරණ

### 01. සිමාසහිත ජාතික ව්‍යාපාර කළමණාකාරිත්ව විද්‍යායතනයේ (NSBM) වෛද්‍ය පීඨයක් ස්ථාපිත කිරීම

රජයට අයත් පූර්ණ ස්වයං මූල්‍ය උත්පාදන ආයතනයක් වන සිමාසහිත ජාතික ව්‍යාපාර කළමනාකාරිත්ව විද්‍යායතනය (NSBM) විසින් අධ්‍යාපන අමාත්‍යාංශයේ, සෞඛ්‍ය අමාත්‍යාංශයේ සහ ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ සෘජු අධීක්ෂණය සහ නියාමනය යටතේ වෛද්‍ය පීඨයක් ස්ථාපිත කිරීමට සහ එමඟින් MBBS උපාධිය පිරිනැමීමට යෝජනා වී තිබේ. එම උපාධි පාඨමාලාව සඳහා වාර්ෂිකව දේශීය හා විදේශීය සිසුන් 500ක් බඳවාගැනීමට අපේක්ෂිත ය. හෝමාගම මූලික රෝහල එම වෛද්‍ය සිසුන් සඳහා සායනික පුහුණුව ලබා දීමට සුදුසු රජයේ රෝහලක් වශයෙන් වෙන් කිරීම පිණිස NSBM ආයතනය විසින් අනුමැතිය ඉල්ලා ඇත. ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ වෛද්‍ය සිසුන්ගේ සායනික පුහුණුව සඳහා හෝමාගම මූලික රෝහල භාවිත කිරීම පිණිස අමාත්‍ය මණ්ඩල අනුමැතිය දැනටමත් ලබා දී ඇති බැවින්, ඊට බලපෑමක් නොවන පරිදි NSBM ආයතනයේ වෛද්‍ය පීඨ සිසුන්ගේ සායනික පුහුණුවට මෙන්ම මහාචාර්ය ඒකක පහසුකම් සඳහා ද සම්පත් බෙදා ගැනීමේ පදනම මත හෝමාගම මූලික රෝහල වෙන් කර දීමේ යාන්ත්‍රණයක් සකස් කිරීමට යෝජනා වී තිබේ. ශ්‍රී ලංකා වෛද්‍ය සභාව විසින් ප්‍රකාශයට පත් කරනු ලැබ ඇති වෛද්‍ය අධ්‍යාපනයේ ප්‍රමිති නියෝගයන්ට අනුකූලව හෝමාගම මූලික රෝහල සංවර්ධනය සඳහා අවශ්‍ය අරමුදල් සැපයීමට NSBM ආයතනය එකඟතාව පළ කර ඇත. ඒ අනුව, හෝමාගම මූලික රෝහල සෞඛ්‍ය අමාත්‍යාංශයේ විෂය පථය යටතට පවරාගෙන ශික්ෂණ රෝහලක් ලෙස උත්ශ්‍රේණිගත කිරීම පිණිස ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

### 02. අස්වැසුම සමාජ සුබසාධක ප්‍රතිලාභ යෝජනා ක්‍රමය යටතේ ප්‍රතිලාභ ලබන පවුල් සවිබලගැන්වීමේ වැඩසටහන

2002 අංක 24 දරන සුබසාධක ප්‍රතිලාභ පනතේ විධිවිධාන අනුව සුබසාධක ප්‍රතිලාභ ගෙවීමේ යෝජනා ක්‍රමයක් පිළියෙල කොට ක්‍රියාත්මක කිරීම පිණිස 2023-04-17 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලබා දී ඇත. ඒ අනුව, අස්වැසුම සමාජ සුබසාධක ප්‍රතිලාභ යෝජනා ක්‍රමය යටතේ ප්‍රතිලාභ ලබන පවුල් අවුරුදු 03ක් ඇතුළත ආර්ථික, සමාජීය හා මානසික වශයෙන් සවිබලගැන්වීම අරමුණු



163, කිරුළපන මාවත, කොළඹ 05, ශ්‍රී ලංකාව.
163, கிருலப்பன அவென்யூ, கொழும்பு 05, இலங்கை.
163, Kirulapona Avenue, Colombo 05, Sri Lanka.
දු தொ T - (+94 11) 2515759
ෆැ பெ F - (+94 11) 2514753
ඊ மி E - dg@dgi.gov.lk
www.dgi.gov.lk
www.news.lk

කර ගනිමින් වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබේ. එකී වැඩසටහනේ මූලික අදියර වශයෙන් දිස්ත්‍රික්ක 25ම ආවරණය වන පරිදි තෝරාගත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල ප්‍රතිලාභී පවුල් 16,000ක් ඉලක්ක කර ගනිමින් ආසියානු සංවර්ධන බැංකු හා ලෝක බැංකු මූල්‍ය ආධාර සහ දේශීය අරමුදල් මගින් නියමු ව්‍යාපෘතියක් ආරම්භ කිරීමටත්, එකී නියමු ව්‍යාපෘතියෙහි ප්‍රතිඵල මත පදනම්ව සියලුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල හඳුනාගත් ප්‍රතිලාභී පවුල් සවිබලගැන්වීම සඳහා අදාළ වැඩසටහන ක්‍රියාත්මක කිරීමටත් කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

**03. ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය සහ චීනයේ ප්‍රමිතිකරණ පරිපාලනය අතර අවබෝධතා ගිවිසුම**

ශ්‍රී ලංකාව හා චීනය අතර තීරු බදු නොවන වෙළෙඳාමේදී මතු වන තාක්ෂණික බාධා අවම කිරීම සඳහා ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය සහ චීනයේ ප්‍රමිතිකරණ පරිපාලනය සමඟ අවබෝධතා ගිවිසුමක් අත්සන් කිරීමට යෝජනා වී තිබේ. අදාළ කෙටුම්පත් අවබෝධතා ගිවිසුම සඳහා නීතිපතිගේ නිෂ්කාශනය සහ විදේශ කටයුතු අමාත්‍යාංශයේ එකඟතාව ලැබී ඇත. ඒ අනුව, එකී අවබෝධතා ගිවිසුම අත්සන් කිරීම පිණිස තාක්ෂණ අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

**04. නාගරික සංවර්ධන අධිකාරියට අයත් ඉඩම් කොටසක් සෞඛ්‍ය හා ඒ ආශ්‍රිත ක්‍රියාකාරකම් සංවර්ධන ව්‍යාපෘතියක් සඳහා බදු පදනම මත බැහැර කිරීම**

නාරාහේන්පිට, කිරිමණ්ඩල මාවතේ පිහිටි නාගරික සංවර්ධන අධිකාරියට අයත් ඉඩම් කොටසක් සෞඛ්‍ය හා ඒ ආශ්‍රිත ක්‍රියාකාරකම් සංවර්ධන ව්‍යාපෘතියක් සඳහා අවුරුදු 50ක කාලසීමාවකට බදු පදනම මත බැහැර කිරීම පිණිස තරගකාරී පදනම මත ආයෝජන යෝජනා කැඳවා ඇත. ඒ සඳහා ලැබී ඇති යෝජනා ඇගයීමෙන් අනතුරුව අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද ස්ථාවර සාකච්ඡා සම්මුති කමිටුවේ නිර්දේශය මත පදනම්ව හෙක්ටයාර 0.1929ක ඉඩම් කොටසක්, නයින්වෙල්ස් හොස්පිටල් ප්‍රයිවට් ලිමිටඩ් සහ ඇක්සස් ඉන්ටර්නැෂනල් ප්‍රයිවට් ලිමිටඩ් ආයතන ඒකාබද්ධව සංස්ථාපනය කරන ලද M/s N W Realty (Pvt.) Ltd. වෙත අවුරුදු 50ක කාලසීමාවකට බදු පදනම මත බැහැර කිරීම පිණිස නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

**05. ඉදිකිරීම, අයිතිය දැරීම සහ ක්‍රියාත්මක කිරීමේ පදනම මත භූමිය මත ස්ථාපිත/පාවෙන සූර්ය ප්‍රකාශ වෝල්ටීයතා විදුලි බලාගාර ස්ථාපනය කිරීම**

මාතර (මෙගාවොට් 10) සහ වව්නතිව් (මෙගාවොට් 08) ග්‍රිඩ උපපොළවල් සඳහා සූර්ය ප්‍රකාශ වෝල්ටීයතා විදුලි බලාගාර මගින් විදුලිය සපයා ගැනීම සඳහා ජාත්‍යන්තර තරගකාරී ලංසු කැඳවා ඇත. ඒ අනුව, ලැබී ඇති ව්‍යාපෘති යෝජනා මත පදනම්ව, අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද සාකච්ඡා සම්බන්ධ කමිටුවේ නිර්දේශ පරිදි, ඉදිකිරීම, අයිතිය දැරීම සහ ක්‍රියාත්ම කිරීම පදනම මත භූමිය මත ඉදි කෙරෙන සූර්ය ප්‍රකාශ වෝල්ටීයතා විදුලිබලාගාරයක් මාතර ග්‍රිඩ උපපොළේ ස්ථාපිත කිරීමේ කොන්ත්‍රාත්තුව Mahawa Solar (Pvt) Ltd. වෙත සහ Heyleys Power Ltd. වෙත පිරිනැමීමටත්, වව්නතිව් ග්‍රිඩ උපපොළේ ස්ථාපිත කිරීමේ කොන්ත්‍රාත්තුව Capital City Holdings (Pvt) Ltd. වෙත පිරිනැමීමටත් විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

**06. ඉදිකිරීම, අයිතිය දැරීම සහ ක්‍රියාත්මක කිරීමේ පදනම මත මෙගාවොට් 100, ඔඩ්ඩමාවඩි, මඩකලපුව සූර්ය බලශක්ති ව්‍යාපෘතිය ස්ථාපනය කිරීම**

පුනර්ජනනීය බලශක්ති තාක්ෂණයන්ගෙන් මෙගාවොට් 50ක් හෝ ඊට වැඩි ධාරිතාවක් සහිත පුනර්ජනනීය බලශක්ති සංවර්ධනය උදෙසා අභිලාෂ ප්‍රකාශ කිරීම් කැඳවීමට 2021-08-30 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලබා දී ඇත. ඒ අනුව, ඉදිරිපත් වූ අභිලාෂය ප්‍රකාශ කිරීම් සැලකිල්ලට ගෙන, අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද ස්ථාවර සාකච්ඡා සම්බන්ධ කමිටුවේ නිර්දේශය පරිදි, වසර 20ක මෙහෙයුම් කාලසීමාවක් සඳහා ඉදිකිරීම, අයිතිය දැරීම සහ ක්‍රියාත්මක කිරීමේ පදනම මත මඩකලපුව ඔඩ්ඩමාවඩි ප්‍රදේශයේ මෙගාවොට් 100ක සූර්ය බලශක්ති ව්‍යාපෘතියක් ස්ථාපනය කිරීමේ ව්‍යාපෘතිය Solar Forge Batticaloa වෙත ප්‍රදානය කිරීම පිණිස විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

**07. 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනත යටතේ ප්‍රමිතිකරණ හා තත්ත්ව පාලන රෙගුලාසි ප්‍රකාශයට පත් කිරීම**

ජාතික ආර්ථිකය, මහජන සෞඛ්‍යය සහ පරිසරය සුරක්ෂිත කිරීමේ අරමුණින් HS කේත 217ක් යටතේ වර්ගීකරණය කරන ලද භාණ්ඩ 122ක භාණ්ඩ ආනයනය කිරීමේදී ප්‍රමිති සහ තත්ත්ව ස්ථාපිත කිරීම පිණිස 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ විධිවිධාන යටතේ 2017 ආනයන හා අපනයන පාලන (ප්‍රමිතිකරණ හා තත්ත්ව පාලන) රෙගුලාසි පනවා ඇත. කඩිනම්, ආරක්ෂිත සහ ඵලදායි වෙළෙඳ ප්‍රවාහනය සඳහා පහසුකම් සැලසීමට මෙන්ම දේශීය නිෂ්පාදන සහ ආනයනික නිෂ්පාදන සඳහා සාධාරණ අවස්ථා සහතික කිරීම පිණිස 2017 ප්‍රමිතිකරණ රෙගුලාසිවල දැනට පවතින ප්‍රමිති සහ තත්ත්ව පරාමිති සංශෝධනය කිරීම අවශ්‍ය බව හඳුනාගනු ලැබ තිබේ. මෙම පසුබිම තුළ ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය විසින් රාජ්‍ය ආයතන, ව්‍යාපාරික සංගම් හා වාණිජ මණ්ඩල ඇතුළු ප්‍රධාන පාර්ශ්වකරුවන් සමඟ සාකච්ඡා කර, පවතින ප්‍රමිති සහ තත්ත්ව පරාමිතින් සංශෝධනය කර යාවත්කාලීන කර ඇත. ඒ අනුව, දැනට බලාත්මකව පවතින 2017 ආනයන හා අපනයන පාලන (ප්‍රමිතිකරණ හා තත්ත්ව පාලන) රෙගුලාසි අගතියකින් තොරව අවලංගු කරමින් 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ විධිවිධාන යටතේ 2024 ආනයන හා අපනයන පාලන (ප්‍රමිතිකරණ හා තත්ත්ව පාලන) රෙගුලාසි පැනවීම පිණිස මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

**08. ජපාන ආර්ථික හා සමාජ සංවර්ධන වැඩසටහන යටතේ ජපන් යෙන් මිලියන 1,600ක ආධාර ජපන් රජය මඟින් ප්‍රදානය කිරීම**

ශ්‍රී ලංකාවේ වත්මන් ආර්ථික අර්බුදය තුළ විපතට පත් ප්‍රජාව සඳහා ක්ෂණික මානුෂීය ආධාර ලබා දීම සහ රටේ ආර්ථික තත්ත්වය වැඩිදියුණු කිරීම උදෙසා රාජ්‍ය අංශය සවිබලගැන්වීම මඟින් ජපාන රජය සිය සහයෝගිතාව පුළුල් කර ඇත. ඒ අනුව, ජපාන ආර්ථික හා සමාජ සංවර්ධන වැඩසටහන යටතේ පහත සඳහන් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා ජපන් යෙන් මිලියන එක්දහස් හයසියයක් (දළ වශයෙන් රුපියල් බිලියන 3.3ක) ප්‍රදානය කිරීමට ජපාන රජය එකඟතාව පළ කර ඇත.

i ශ්‍රී ලංකා වෙරළාරක්ෂක බලකායේ තෙල් කාන්දු සඳහා ප්‍රතිචාර සහ කළමනාකරණය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය

ii උතුරු පළාතේ ප්‍රධාන රෝහල්වල මාතෘ සහ ළමා ප්‍රතිකාර සඳහා ආධාරක උපකරණ සැපයීමේ සහ උතුරු පළාතේ වෘත්තීය පුහුණු මධ්‍යස්ථානවල ඇහළුම් පාඨමාලා සඳහා ආධාරක උපකරණ ලබා දීමේ ව්‍යාපෘතිය

iii උතුරු හා නැගෙනහිර පළාත්වල ධීවරයින්ගේ ආරක්ෂාව සඳහා ආධාරක උපකරණ ලබා දීමේ ව්‍යාපෘතිය

ඒ අනුව, ඉහත ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා ජපාන ආර්ථික හා සමාජ සංවර්ධන වැඩසටහන යටතේ ප්‍රදාන ආධාර ලබා ගැනීම සඳහා ජපාන රජය සමඟ හුවමාරු පත්‍ර සහ වෙනත් අදාළ ලියකියවිලි අත්සන් කිරීම පිණිස මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

## 09. ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සමානාත්මතාව පිළිබඳ පනත් කෙටුම්පත

ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සමානාත්මතාව පිළිබඳ පනත් කෙටුම්පත සකස් කිරීම සඳහා 2022-09-05 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලබා දී ඇත. ඒ අනුව සකස් කරනු ලැබ ඇති ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සමානාත්මතාව පිළිබඳ පනත් කෙටුම්පත සඳහා නීතිපතිගේ නිෂ්කාශනය ලැබී ඇති අතර, එකී පනත් කෙටුම්පත රජයේ ගැසට් පත්‍රයේ පළ කිරීමටත්, ඉන් අනතුරුව අනුමැතිය සඳහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමටත් කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

## 10. Glocal Fair දිස්ත්‍රික් ජංගම සේවා වැඩසටහන් මාලාව 2024 - "ජයගමු ශ්‍රී ලංකා"

ගෝලීය අවශ්‍යතාවන්ට ගැලපෙන පරිදි රටේ ශ්‍රම වෙළෙඳපොළ ප්‍රතිනිර්මාණය කිරීමේ අරමුණින් සැලසුම් කරන ලද පුළුල් වැඩසටහනක් ලෙස කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය යටතේ පවතින ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය, මිනිස්බල සහ රැකිරක්ෂා දෙපාර්තමේන්තුව, කම්කරු දෙපාර්තමේන්තුව, ශ්‍රම වාසනා අරමුදල සහ අනෙකුත් ආයතන විසින් සපයනු ලබන සියලු සේවාවන් එකම ස්ථානයකින් මහජනතාවට තම පදිංචි ප්‍රදේශවලදී පහසුවෙන් ලබා ගැනීමට හැකි වන පරිදි Glocal Fair දිස්ත්‍රික් ජංගම සේවා වැඩසටහන්

මාලාවක් දිස්ත්‍රික්ක 25 පුරා පැවැත්වීමට කටයුතු සැලසුම් කර ඇත. විගමනික ශ්‍රමිකයින් සහ අනාගත ශ්‍රම වෙළෙඳපොළට එක් වීමට නියමිත ඔවුන්ගේ තරුණ දූ දරුවන් හට අධ්‍යාපන හා වෘත්තීය කුසලතා වැඩිදියුණු කර ගැනීමට පහසුකම් හා අවස්ථාවන් හඳුන්වා දීම සහ විගමනික ශ්‍රමිකයන්ගේ ජීවන තත්ත්වය තවදුරටත් ඉහළ නැංවීමට හා ඔවුන්ගේ ගැටලු විසඳා ගැනීමට අවස්ථාවන් ලබා දීම මෙමඟින් අපේක්ෂා කෙරේ. ඒ අනුව, කම්කරු හා විදේශ රැකියා අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව පරිදි එම අමාත්‍යාංශය යටතේ පවතින ආයතන මඟින් සියලුම දිස්ත්‍රික්කවල Glocal Fair දිස්ත්‍රික් ජංගම සේවා වැඩසටහන් මාලාව පැවැත්වීමට අදාළව ගනු ලබන පියවර සම්බන්ධයෙන් අමාත්‍ය මණ්ඩලයේ එකඟතාව ලබා දීමට තීරණය කරන ලදී.

## 11. 1990 අංක 4 දරන බැංකු මඟින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත් කෙටුම්පත

ණය ගැනුම්කරුවන් විසින් නොගෙවා පැහැර හරින ලද ණය අයකර ගැනීම සඳහා එම ණය වෙනුවෙන් උකස් කරනු ලැබ ඇති යම් දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට අදාළ බැංකු විසින් ගනු ලබන ක්‍රියාමාර්ග 2024-12-15 දින දක්වා තාවකාලිකව අත්හිටුවීමටත්, ඒ සඳහා විධිවිධාන සැලසීම පිණිස 1990 අංක 4 දරන බැංකු මඟින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත සංශෝධනය කිරීමටත් 2024-02-26 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලබා දී ඇත. ඒ අනුව, නීති කෙටුම්පත් සම්පාදක විසින් සකස් කරනු ලැබ ඇති බැංකු මඟින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත් කෙටුම්පත සඳහා නීතිපතිගේ නිෂ්කාශනය ලැබී ඇති අතර, එකී පනත් කෙටුම්පත රජයේ ගැසට් පත්‍රයේ පළ කිරීමටත්, ඉන් අනතුරුව අනුමැතිය සඳහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමටත් මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

*************